Australian Government
Department of Home Affairs

# ඕස්ට්‍රේලියාවේ රැඳී සිටීම

## මා හට ස්ථිර පදිංචි වීසා බලපත්‍රයක් ඇත

ස්ථිර පදිංචි වීසා (Permanent Resident (PR)) බලපත්‍රධාරීන් හට ඕස්ට්‍රේලියාවේ නියමයක් නැති ආකාරයට රැඳී සිටිය හැකි මුත් ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටතට ගොස් නැවත පැමිණීමට අදහස් කරන්නේ නම්, ඔබගේ ස්ථිර වීසා බලපත්‍රයේ ගමන් පහසුකම් ඇති කාලය සම්බන්ධයෙන් සොයා බැලිය යුතුය (සාමාන්‍යයෙන් වසර පහයක කාලයක්).

ඔබට පහත ආකාරට පරීක්ෂා කර බැලිය හැකියඃ

- VEVO සේවාව උපයෝගී කරගෙන, නැතිනම්
- ImmiAccount ඔස්සේ ඔබගේ වීසා බලපත්‍ර කොන්දේසි සඳහා ප්‍රවේශවීම.

ඔබගේ ස්ථිර වීසා බලපත්‍රයේ ගමන්කල හැකි කාලය අවසන්වී ඇති අවස්ථාවක ඔබ තාවකාලික වීසා බලපත්‍රයක් යටතේ ඕස්ට්‍රේලියාවට ඇතුළුවුණි නම්, මේ මගින් ඔබට අවාසිදායක ආකාරයට බලපෑම් ඇතිවේ. වැඩිදුර විස්තර සඳහා 'Resident Return visa' බලන්න.

## මා හට තාවකාලික වීසා බලපත්‍රයක් ඇත

### මා හට තාවකාලික වීසා බලපත්‍රයක් හෝ ඉලෙක්ට්‍රොනික ගමන් අධිකාරියක් (Electronic Travel Authority (ETA)) ඇත

ඕස්ට්‍රේලියානු සංක්‍රමණ නීතිය යටතේ, සංචාරක වීසා බලපත්‍රයක් හෝ ETA බලපත්‍රයක් දීර්ඝ කිරීම කල නොහැක. ඔබගේ වර්තමාන වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වීමට පෙර නව වීසා බලපත්‍රයකට අයදුම්කල යුතුය.

ඔබගේ වීසා බලපත්‍රයේ ‘තව දුරටත් රැඳී සිටිය නොහැක’ යන කොන්දේසිය ඇතිනම්, ඕනෑම වීසා බලපත්‍රයක් සඳහා අයදුම් කිරීමට පෙර ඔබ විසින් මෙම කොන්දේසිය ඉවත් කිරීමට ඉල්ලා සිටිය යුතුය.

ඔබ සැලසුම් කල ආකාරයට ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යා නොහැකිනම්, ඔබ ඕස්ට්‍රේලියාවේ නීත්‍යානුකූලව සිටින බවට වග බලා ගැනීම සඳහා ඔබට මෙහි සිටීමට අනුමැතිය ලබා දුන් කාලය, වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වන දිනය සහ වීසා කොන්දේසි පරීක්ෂාකර ගන්න.

ඔබට VEVO, myVEVO app, ඔබගේ වීසා ප්‍රදාන ලිපියේ හෝ ඔබගේ ImmiAccount වෙතින් ඔබගේ වීසා තොරතුරු බලාගත හැකිය. අපගේ Check an ETA සේවාව ඔස්සේ ඔබගේ ETA හි කල් ඉකුත්වන දිනය සහ වීසා කොන්දේසි බලාගත හැකිය.

ඔබ නව වීසා බලපත්‍රයකට අයදුම් කරන විට, ඔබගේ වීසා අයදුම්පත්‍රය සම්බන්ධයෙන් තීරණයක් ගන්නා තෙක් ඔබව ඕස්ට්‍රේලියාවේ නීත්‍යානුකූලව සිටීම සඳහා බ්‍රිජිං වීසා බලපත්‍රයක් ප්‍රදානය කරනු ඇත.

ඔබගේ වීසා බලපත්‍රයේ කාලය දැනටමත් ඉකුත්වී ඇතිනම්, වීසා බලපත්‍රයක් නොමැත යන්න බලන්න.

## වීසා කොන්දේසි

### වැඩ කිරීමට නොහැකි කොන්දේසිය

සංචාරක වීසා බලපත්‍ර සහ ETA බලපත්‍ර ඇති අයට ඕස්ට්‍රේලියාවේ වැඩ කිරීමට අවසර නැත.

## වීසා බලපත්‍රය මත රැඳී සිටීමේ කාලය

දැනට ඇති වීසා බලපත්‍රයක් මත රැඳී සිටීමේ කාලය දීර්ඝ කල නොහැක. ඔබට රැඳී සිටීමට දී ඇති කාල සීමාව අවසානයේ ඔබ තවදුරටත් ඕස්ට්‍රේලියාවේ රැඳී සිටිනම්, ඔබගේ වීසා බලපත්‍රය අවසානයට පත්වේ. ඔබගේ වීසා බලපත්‍රය යටතේ ඔබට රැඳී සිටීමට දී ඇත කාලය අවසානයේ ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යා නොහැකිනම්, ඔබගේ වීසා බලපත්‍රය අවසන්වන දිනට පෙර නව වීසා බලපත්‍රයකට අයදුම්කල යුතුය.

ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව ඕස්ට්‍රේලියාව වෙත පැමිණෙන ලොව වටා යන කෲස් නෞකා ගමනකට සම්බන්ධවූණි නම්, ඔබට ඕස්ට්‍රේලියාවේ රැඳී සිටීමට අනුමැතිය ඇති කාලය සම්බන්ධයෙන් මෙය ඕස්ට්‍රේලියාවෙන් පිටත්වීමක් ලෙස සලකනු නොලැබේ. ඔබගේ කෲස් නෞකා සමාගම විසින් ලබාදී ඇති තොරතුරු පරීක්ෂාවෙන් බලන්න.

### වැඩිදුරටත් රැඳී සිටිය නොහැකි කොන්දේසිය (8503, 8534 සහ 8535 ඇතුලත්ය)

ඔබ 8503, 8534 හෝ 8535 යන කොන්දේසි ඇතුලත් වීසා බලපත්‍රයක් දරයි නම් සහ සැලසුම් කල පරිදි ඕස්ට්‍රලියාවෙන් පිටත්ව යා නොහැකිනම්, අදාල කොන්දේසිය අත්හැර දමන තෙක් ඕස්ට්‍රේලියාව තුල වෙනත් බොහෝ වීසා බලපත්‍රවලට අයදුම් කල නොහැක. ඔබගේ වීසා බලපත්‍රය සති 4කට වඩා අඩු කාලයකදී කල් ඉකුත්වේ නම්, [මෙම කොන්දේසිය ඉවත් කිරීම සඳහා ඉල්ලීමක් කල හැකිවේ.]() ඔබගේ ඉල්ලීම අනුමත කලහොත්, ඔබගේ වර්තමාන වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වීමට පෙර නව වීසා අයදුම්පත්‍රයක් යොමුකල යුතුය.

### 8531 කොන්දේසිය (වීසා බලපයත්‍රය මගින් ලබාදුන් කාලයට ඔබ්බෙන් ඕස්ට්‍රේලියාවේ රැඳී නොසිටිය යුතුය)

ඔබ 8531 යන කොන්දේසිය ඇතුලත් වීසා බලපත්‍රයක් දරයි නම් සහ සැලසුම් කල පරිදි ඕස්ට්‍රලියාවෙන් පිටත්ව යා නොහැකිනම්, ඔබගේ වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වී යාමට පෙර වෙනත් වීසා බලපත්‍රයකට අයදුම්කල යුතුය. ඔබ 8503 කොන්දේසියටද යටත්නම්, මෙම කොන්දේසිය ඉවත් කිරීම සඳහා මුලින්ම ඉල්ලීමක් කල යුතුය.

ගමන් සීමා හේතුවෙන් සමහර අයහට ඕස්ට්‍රේලියාවෙන් පිටතට යාමට නොහැකි බව අප අවබෝධ කරගෙන සිටින අතර ඕනෑම අනාගත වීසා හෝ අනුග්‍රාහක අයදුම්පත්‍ර සම්බන්ධයෙන් එම කරුණු සැලකිල්ලට ගනු ඇත.

### 8558 කොන්දේසිය (ඕනෑම මාස 18ක කාල පරිච්ඡේදයකින් මාස 12කට වඩා කාලයක් ඕස්ට්‍රේලියාවේ සිටිය නොහැක)

ඔබ 8558 යන කොන්දේසිය ඇතුලත් වීසා බලපත්‍රයක් දරයි නම් සහ සැලසුම් කල පරිදි ඕස්ට්‍රලියාවෙන් පිටත්ව යා නොහැකිනම්, ඔබ එක දිගට වරකට මාස 12ක කාලයක් ඕස්ට්‍රේලියාවේ රැඳී සිටියහොත් ඔබගේ වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වේ.

ඔබ මාස 18ක කාලයක් තුල ඕස්ට්‍රේලියවේ රැඳී සිටි කාලය එක්ව බැලූ විට මාස 12ක් නම්, ඔබගේ වීසා බලපත්‍රය, වීසා බලපත්‍රයේ කාල ඉකුත්වන තෙක් තවදුරටත් වලංගුව පවතී.

ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යාමට හැකිවීමට පෙර වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වේ නම්, ඔබ විසින් වෙනත් වීසා බලපත්‍රයකට අයදුම් කල යුතුය. ඔබ 8503 කොන්දේසියටද යටත්නම්, මෙම කොන්දේසිය ඉවත් කිරීම සඳහා මුලින්ම ඉල්ලීමක් කල යුතුය.

## වීසා බලපත්‍ර සලකා බැලීමේ වැඩපිළිවෙලවල්

ඔබ හට ඕස්ට්‍රේලියාවේ රැඳී සිටීම සඳහා නව වීසා බලපත්‍රයකට අයදුම්කල යුතුනම්, ඔබට ඇති වීසා විකල්පයන් සොයා බලා [ImmiAccount]() ඔස්සේ වීසා අයදුම්පත්‍රයක් යොමුකල හැකිය. හැකි සෑම අවස්ථාවකම මාර්ගගතව අයදුම් කරන ලෙස උනන්දු කරනුයේ මෙම අයදුම්පත් වඩා සීඝ්‍රයෙන් සලකා බැලීම හේතුවෙනි.

වීසා අයදුම්පත්‍ර සම්බන්ධ සමහරක් සේවා කෝවිඩ්-19 හේතුවෙන් බලපෑමට ලක්වී තිබිය හැකිය. එසේම අප විසින් විශ්වාසය තබා ඇති සේවා ගණනාවක් (වෛද්‍ය පරීක්ෂණ සහ ජීවමිතික රැස්කිරීම් ආදී) ලබාගත නොහැකිය. පරීක්ෂණ සම්පූර්ණ කිරීම සහ ඉල්ලා සිටින තොරතුරු ලබාදීමට අයදුම්කරුවන් හට වැඩිපුර කාලයක් ලබාදේ.

ඔබගේ වීසා අයදුම්පත්‍රය සලකා බැලීමේදී සේවා සම්බන්ධ ඇතිවී තිබෙන බාධාවන් සැලකිල්ලට ගනු ලැබේ.

මෙම පරීක්ෂණ සම්පූර්ණ කිරීම සඳහා වැඩිපුර කාලය ඉල්ලීමට අප හා සම්බන්ධවිය යුතු නැත.

## මා හට ශිෂ්‍ය වීසා බලපත්‍රයක් ඇත

### මම කෝවිඩ්-19 තීරණාත්මක අංශයක වැඩ කරයි (කෘෂිකර්මය, සෞඛ්‍යය, වයෝවෘද්ධ රැකවරණ සහ සුපර්මාර්කට්)

#### නවීන යාවත්කාලීනයන්/මාධ්‍ය ප්‍රකාශන

- කොරෝනාවයිරස් කලායේදී සෞඛ්‍යය සහ ආබාධිත සේවකයන්ගේ සංඛ්‍යාව වැඩි කිරීම
- කොරෝනා වයිරස් සහ තාවකාලික වීසා බලපත්‍රධාරීන්
- ඕස්ට්‍රේලියානු ප්‍රධාන පෙලේ සුපර්මාර්කට් විසින් සිය රාක්ක පුරවා තැබීමට උපකාර කිරීම සඳහා ජාත්‍යන්තර සිසු සිසුවියන් හට තාවකාලිකව වැඩිපුර පැය ගණනක් ලබාදිය හැකිවේ
- ජාත්‍යන්තර සිසු සිසුවියන් මගින් වයෝවෘද්ධ රැකවරණවල ඇති තීරණාත්මක සේවක හිඟය පියවීම.

කෝවිඩ්-19 සීමා හේතුවෙන් පංතියට පැමිණීම හෝ මාර්ගගත ඉගෙනීම උපයෝගී කර ගැනීම වැනි ශිෂ්‍ය වීසා බලපත්‍ර කොන්දේසි සපුරාලීමට නොහැකිවූ අය සම්බන්ධයෙන් රජය සුනම්‍ය ප්‍රවේශයක් ගනී.

ඔබගේ ඔස්ට්‍රේලියාවේ ඉගෙනීමේ කටයුතු අවසාන වන්නේ නම්, සහ ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යාමට නොහැකිනම්, ඔබ විසින් සංචාරක වීසා බලපත්‍රයකට (උපකාණ්ඩ 600) අයදුම් කල හැකිය. ඔබගේ ශිෂ්‍ය වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වීමට පෙර මෙය කල යුතුය.

### ඔබගේ පාඨමාලාව 'සැසියෙන් පිට' තිබේනම්

ඔබගේ පාඨමාලාව 'සැසියෙන් පිට' ඇති බවට සැලකිය හැකිනම්, ඔබට අසීමිත පැය ගණනක් වැඩ කල හැකිය. පාඨමාලා සැසියෙන් පිට ලෙස සලකනු ලබන්නේ කලින් පිළියෙල කරගත් පරිදි පාඨමාලා නිවාඩු කාලවලදී හෝ කලින් පිළියෙල කරගත් පරිදි සිසු සිසුවියන් සිය පාඨමාලාව අවසන්කර ඇති අවස්ථාවලදීය.

### ඔබ පර්යේෂණ මගින් මාස්ටර්ස් පාඨමාලාවක් හෝ ඩොක්ටරේට් පාඨමාලාවක් ඉගෙන ගනිමින් සිටීනම්

ඔබ පර්යේෂණ මගින් මාස්ටර්ස් පාඨමාලාවක් හෝ ඩොක්ටරේට් පාඨමාලාවක් ඉගෙනීම ආරම්භ කර ඇතිනම්, ඔබට අසීමිත පැය ගණනක් වැඩකල හැකිය.

### ඔබගේ පාඨමාලාව කල්දමා (defer) ඇතිනම්

ඔබගේ පාඨමාලාව කල්දමා ඇතිනම්, සති දෙකකට පැය 40කට වඩා වැඩ කල හැකිය.

### සමහර ජාත්‍යන්තර සිසුන් සම්බන්ධ බැහැර කිරීම්

ඕස්ට්‍රේලියානුවන් හට අවශ්‍ය අත්‍යාවශ්‍ය භාණ්ඩ සහ සේවා සැපයීමට උපකාර වන්නේ නම්, සමහර ශිෂ්‍ය වීසා බලපත්‍ර දරණ පහත අයහට සතියකට පැය 40කට වඩා වැඩ කල හැකියඃ

- හෙද ක්ෂේත්‍රයේ සේවයේ යෙදී සිටින, සෞඛ්‍යයට අදාල පාඨමාලාවක් කිරීමට ඇතුළුවී සිටීනම් (හෙද හෝ වෛද්‍ය වැනි) සහ කෝවිඩ්-19 ට එරෙහි උත්සාහය සම්බන්ධයෙන් උපකාර කරන ලෙසට සෞඛ්‍යය බලධාරීන් විසින් නියම කර ඇතිනම්
- ලියාපදිංචි සුපර්මාර්කට් හි සේවයේ යෙදී සිටින අය (2020 මැයි 1 දින මෙම තාවකාලික වැඩපිළිවෙල අවසානයට පත්වනු ඇත)
- අනුමත කල සේවා සපයන්නෙකු හෝ කොමන්වෙල්ත් මගින් අරමුදල් ලබාදෙන වයෝවෘද්ධ රැකවරණ සේවා සපයන්නෙකු මගින් වයෝවෘද්ධ රැකවරණවල සේවයේ යොදවා ඇති විට
- ජාතික ආබාධිත රක්ෂණ වැඩසටහන හා ලියාපදිංචිවුණු සේවා සපයන්නෙකබ මගින් සේවයේ යොදවා ඇතිවිට

ශිෂ්‍ය වීසා බලපත්‍ර දරණ අය සඳහා වැඩකරන පැය ගණන තාවකාලිකව ලිහිල් කිරීම බලන්න.

## මාගේ ශිෂ්‍ය වීසා බලපත්‍රය දීර්ඝ කරගත හැකිද?

ඕස්ට්‍රේලියානු සංක්‍රමණ නීතිය යටතේ, ශිෂ්‍ය වීසා බලපත්‍රයක් දීර්ඝ කිරීම කල නොහැක.

පහත තත්වයන් ඇතිනම්, ඔබ විසින් නව වීසා බලපත්‍රයකට අයදුම් කල යුතුය:

- ඔබගේ වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වන්නේ නම්, සහ ඔබට සිය රටට නැවත යාමට නොහැකිනම්
- ඔබගේ පාඨමාලාව අවසන් කිරීමට වැඩිපුර කාලය අවශ්‍යනම්.

ඔබගේ දැනට ඇති වීසා බලපත්‍රය අවසානවීමට සති හයකට පෙර නව ශිෂ්‍ය වීසා බලපත්‍රයකට අයදුම් කල යුතුය. ඔබගේ ශිෂ්‍ය වීසා අයදුම්පත්‍රය සමග කෝවිඩ්-19 හේතුවෙන් ඔබට බලපෑමක් අතිවූ බවට සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය නැත.

ඔබගේ ඕස්ට්‍රේලියාවේ ඉගෙනීමේ කටයුතු අවසාන නම්, ඔබ විසින් සංචාරක වීසා බලපත්‍රයකට (උපකාණ්ඩ 600) අයදුම් කල හැකිය. ඔබගේ ශිෂ්‍ය වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වීමට පෙර ඔබ මෙය කල යුතුය.

සංචාරක වීසා බලපත්‍රය සම්බන්ධ වැඩිදුර විස්තර

වීසා අයදුම්පත්‍ර ක්‍රියාවලිය හා සම්බන්ධ සමහර සේවාවලට බලපෑම් ඇතිවිය හැකි අතර සමහර සේවා ලබාගත නොහකි තත්වයට පත්වෙමින් ඇත. මේවා අතර වෛද්‍ය පරීක්ෂණ සිදු කරන පැනල් වෛද්‍යවරුන්, ඉංග්‍රීසි භාෂා පරීක්ෂණ සිදුකරන පහසුකම් සහ ජීවමිතික රැස්කිරීම් ඇත. මෙම සේවා ලබාගත නොහැකිව තිබෙන අතර බොහෝ අයදුම්කරුවන් හට වීසා අවශ්‍යතාවයන් සපුරාලිය නොහැක. සිසු සිසුවියන් හට අදාල පරීක්ෂණ සම්පූර්ණ කිරීමට සහ ඉල්ලා සිටින ලද තොරතුරු ලබාදීම සඳහා අමතර කාලය ලබාදෙනු ඇත.

කෙසේවුවද, ඔබගේ වර්තමාන වීසා බලපත්‍රයේ කාලය අවසන්වීමට පෙර නව අයදුම්පත්‍රයක් යොමු කිරීම මගින් ඔබ විසින් සියළු අවශ්‍යතාවයන් සපුරාලන තෙක් ඔබට නීත්‍යානුකූලව රැඳී සිටීමට බ්‍රිජිං වීසා බලපත්‍රයක් ලබාදේ.

## ඕස්ට්‍රේලියානු ඉගෙනීමේ අවශ්‍යතා

ස්වදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තු මගින් ඉගෙනුම කරන ආකාරය සම්බන්ධව නියාමනය නොකරයි. ඒ සම්බන්ධයෙන් ඔබ විසින් ඔබගේ අධ්‍යාපන සපයන අය සමග සම්බන්ධවිය යුතුය.

සුනම්‍ය ආකරයට පාඨමාලා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් TEQSA හා ASQA මගින් එක්ව කරන ලද ප්‍රකාශය බලන්න.

ගමන් සීමා හේතුවෙන ඇති ව්‍යාතිරේක සඤහා බලපෑමට ලක්වූ තෘතීය සිසු සිසුවියන් සඳහා ඇතිකරන ලද බැහැර කිරීම් සම්බන්ධ මාර්ගගත ඉගෙනීම සම්බන්ධයෙන් ජාතික සංග්‍රහයේ ඇති අවශ්‍යතා බලන්න.

## දෙපාර්තමේන්තුවට දැනුම්දීම

ඔබ නැවත මව් රටට යන්නේ නම් හෝ ඔබගේ ඉගෙනීමේ තත්වය වෙනස්වුණි නම්, ඔබ විසින් දෙපාර්තමේන්තුව හට දැනුම් දිය යුතු නැත.

ඔබගේ වීසා බලපත්‍රය වෙනත් වීසා බලපත්‍රයකට අයදුම් කරන තෙක් හෝ ඔබගේ වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වන තෙක් වලංගුව පවතී. ඔබ නැවත මව්බිමට ගියහොත් හෝ ඉගෙනීම ප්‍රමාද කලහොත් ඔබගේ වීසා තත්වය වෙනස් නොවී පවතී.

## මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දෙන සිසු සිසුවියන්

ඕස්ට්‍රේලියාව තුල දිගටම සිටීම සඳහා පවුලේ අයගේ උපකාර, හැකි අවස්ථාවල අර්ධ-කාලීන වැඩ සහ ඔබගේ ඉතිරිකිරීම් උපයෝගී කරගන්නා ලෙසට ඔබව උනන්දු කෙරේ.

ඔබට සිය කටයුතු කරගෙන සිටීමට නොහැකිනම්, ඔබගේ සාමාන්‍ය වශයෙන් පදිංචිව සිටින රටට යාමට කටයුතු කල යුතුය. සියළුම ශිෂ්‍ය වීසා බලපත්‍ර නිකුත් කිරීමේදී ඔවුන් විසින් ඕස්ට්‍රේලියාවේ රැඳී සිටින මුළු කාලය සඳහා අරමුදල් වෙත ප්‍රවේශය ඇති බවට කොන්දේසියක් සියළු ශිෂ්‍ය වීසා බලපත්‍රවල ඇති බවට සටහන් කර ගන්න.

ඕස්ට්‍රේලියාවේ මාස 12කට වඩා වැඩිපුර සිටින මූල්‍ය දුෂ්කරතා ඇති සිසු සිසුවියන් විසින් සිය ඕස්ට්‍රේලියානු සුපර්ඇනුවේෂන් හි ඇති මුදල්වලට ප්‍රවේශවිය හැකිය.

මූල්‍ය දුෂ්කරතාවලට මුහුණදෙන ජාත්‍යන්තර සිසු සිසුවියන් හට උපකාර ලබාදෙන ජාත්‍යන්තර අධ්‍යාපන ක්ෂේත්‍රය සමග දිගින් දිගටම ඕස්ට්‍රේලියානු රජය එක්ව කටයුතු කරයි.

## මා හට තාවකාලික කුසලතා හිඟ වීසා බලපත්‍රයක් (උපකාණ්ඩ 482) (Temporary Skill Shortage visa (subclass 482)) හෝ තාවකාලික රාජකාරි (කුසලතා) (උපකාණ්ඩ 457) (Temporary Work (Skilled) visa (subclass 457)) ඇත

තාවකාලික කුසලතා හිඟ සහ 457 උපකාණ්ඩ වීසා බලපත්‍රධාරීන්ව තාවකාලිකව වැඩ නවත්වා (stood down) ඇති නමුදු සේවය අවසන් කර නැතිනම් (laid off) ඔවුන්ගේ වීසා බලපත්‍ර වලංගුව පවතින අතර සාමාන්‍ය වැඩපිළිවෙලවල් යටතේ සිය වීසා බලපත්‍ර දීර්ඝ කර දීම සඳහා ව්‍යාපාරවලට අවස්ථාව ඇත.

ඔබගේ වීසා කොන්දේසිවලට අනුකූල වන ආකාරයට හෝ සෙවායෝජකයන්ගේ වගකීම්වලට අනුකූල වන ආකාරයට ඔබගේ පැය ගණන් අඩු කිරීමට ව්‍යාපාරවලට හැකිවේ.

ඔබගේ වැඩ නවත්වා දැනට රැකියාවක් නැතිව සිටිනම්, දින 60ක් ඇතුලත වෙනත් සේවායෝජකයෙකු සොයාගත යුතුය, නැතිනම්, හැකි අවස්ථාවල ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යා යුතුය.

ඔබට සිය මව්බිමට යා නොහැකිනම්, වලංගු වීසා බලපත්‍රයක් පවත්වා ගත යුතු අතර අවශ්‍ය අවස්ථාවලදී ඕස්ට්‍රේලියාවේ සෞඛ්‍යය උපදෙස් පිළිපැදිය යුතුය.

සෞඛ්‍යය, වයෝවෘද්ධ රැකවරණ හෝ කෘෂිකර්මාන්ත ආදී තීරණාත්මක අංශවල දැනට වැඩ කරන තාවකාලික වීසා බලපත්‍ර දරණ අය කෝවිඩ්-19 වසංගත තාවකාලික ක්‍රියාකාරකම් වීසා බලපත්‍ර (උපකාණ්ඩ 408) රජය මගින් අනුමත එකඟතා ඉසව් කාණ්ඩය යටතේ වීසා බලපත්‍රයකට (COVID-19 pandemic Temporary Activity Visa (subclass 408) Australian Government Endorsed Agreement Event (AGEE) stream visa) අයදුම් කිරීමට සුදුසු විය හැකිය.

## මා හට නිවාඩු ගතකරන අතර වැඩ කිරීම සඳහා වීසා බලපත්‍රයක් ඇත

### කෝවිඩ්-19 සම්බන්ධ තීරණාත්මක අංශයක මම වැඩ කරයි (කෘෂිකර්මාන්ත, සෞඛ්‍යය, වයෝවෘද්ධ රැකවරණ හෝ සුපර්මාර්කට්)

නිවාඩු ගතකරන අතර වැඩ කරන වීසා බලපත්‍රයක් දීර්ඝ කල නොහැක. කෙසේවුවද, ඔබ ඕස්ට්‍රේලියාවේ නියමිත වැඩ මාස තුනක් හෝ හයක් සම්පූර්ණ කර ඇතිනම්, ඔබ හට දෙවන නිවාඩු ගතකරන අතර වැඩකරන වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට හැකිය.

කෝවිඩ්-19 ට ප්‍රතිචාර වශයෙන් ඕස්ට්‍රේලියානු රජය මගින් නව කියා මාර්ග හඳුන්වා දී ඇත. නිවාඩු ගතකරන අතර වැඩ කරන වීසා බලපත්‍රයක් ඇති කෘෂිකර්මාන්තය, සෞඛ්‍යය, වයෝවෘද්ධ සහ ආබාධිත රැකවරණ සහ ළමා සුරැකුම් ඇතුළු තීරණාත්මක අංශවල වැඩ කරන අයව එක් සේවායෝජකයෙකු සමග මාස හයක් පමණක් වැඩ කිරීම සම්බන්ධ සීමාව ඉවත් කර ඇත.

නියමිත වැඩ කරන තීරණාත්මක අංශයක වැඩ කරන නිවාඩු ගතකරන අතර වැඩ කරන වීසා බලපත්‍රයක සිටින එහෙත් දෙවන හෝ තෙවන නිවාඩු ගතකරන වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට අවශ්‍ය මාස 3 හෝ 6 නියමිත වැඩ සම්පූර්ණකර නැති සහ මව්බිමට යාමට නොහැකි අය හට කෝවිඩ්-19 වසංගත තාවකාලික ක්‍රියාකාරකම් වීසා බලපත්‍ර (උපකාණ්ඩ 408) රජය මගින් අනුමත එකඟතා ඉසව් කාණ්ඩය යටතේ වීසා බලපත්‍රයකට (COVID-19 pandemic Temporary Activity Visa (subclass 408) Australian Government Endorsed Agreement Event (AGEE) stream visa) අයදුම් කල හැකි අතර අයදුම්පත්‍ර ගාස්තුවක් නැත. මෙම වීසා බලපත්‍ර මගින් ඔබට නීත්‍යානුකූලව ඕස්ට්‍රේලියාවේ රැඳී සිටීමට

ඉඩ ලබාදෙන අතර ඔබට නැවත ආරක්ෂිතව සහ ප්‍රායෝගික වශයෙන් ඔබගේ මව්බිමට යාමට හැකිවන තුරු ඔබට අවශ්‍ය නම්, දිගටම වැඩ කරගෙන සිටිය හැකිය.

නව වීසා බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා, වයස, ඉංග්‍රීසි භාෂාව, සෞඛ්‍යය සහ චරිතය සම්බන්ධ අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය.

## 8547 වීසා කොන්දේසිය - එක් සේවායෝජකයෙකු සමඟින් මාස හයක් වැඩකලහැකි බවට වූ සීමාව

නිවාඩු ගතකරන අතර වැඩ කරන වීසා බලපත්‍රයක් ඇති අය හට ඔවුන් ඕස්ට්‍රේලියාවේ සිටින අතරතුර ඕනෑම වැඩක නිරත විය හැකිය. දෙපාර්තමේන්තුව මගින් එක් සේවායෝජකයෙකු සමඟ වැඩකරන කාලය මාස හයකට වඩා කිරීමට අනුමැතිය දී ඇතිනම් මිස සාමාන්‍යයෙන් එක් සේවායෝජකයෙකු සමඟ වැඩකල හැකි කාලය මාස හයකි.

නිවාඩු ගතකරන අතර වැඩ කරන වීසා බලපත්‍රයක් ඇති සෞඛ්‍යය, වයෝවෘද්ධ සහ කෘෂිකර්මාන්තය, ආබාධිත රැකවරණ වැනි තීරණාත්මක අංශවල වැඩ කරන අය හට විශේෂ, කලින් නොදුටු තත්වයන් යටතේ එක් සේවායෝජකයෙකු සමඟ මාස හයකට වඩා වැඩි කාලයක් වැඩ කිරීමට දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබාදී ඇත.

නිවාඩු ගතකරන අතර වැඩ කරන වීසා බලපත්‍රයක් ඇති අය හට එක් සේවායෝජකයෙකු සමඟින් මාස හයකට වැඩි කාලයක් වැඩකිරීමට දෙපාර්තමේන්තුව මගින් ලබාදෙන අනෙක් අවස්ථාවන් අතර පහත අවස්ථා ඇතː

- විවිධ ස්ථානවල වැඩ කරන අතර එක් ස්ථානයක මාස හයක් ඉක්මවා නොයන අවස්ථාව
- ඕස්ට්‍රේලියාවේ ඕනෑම ස්ථානයක සත්ව සහ ශාබ වගාව
- නොදර්න් ඕස්ට්‍රේලියාවල පමණක් සමහර කර්මාන්තවල
- ලැව්ගිනිවලින් යථා තත්වයට පත්වීමේ උත්සාහයන්

වෙන ඕනෑම අවස්ථාවක, එකම සේවායෝජකයා සමඟ මාස හයකට වැඩියෙන් වැඩ කිරීම සඳහා ඔබ විසින් අනුමැතිය ලබාගත යුතුය.

## මම කෝවිඩ්-19 සම්බන්ධ තීරණාත්මක නොවන අංශයක වැඩ කරයි

නිවාඩු ගතකරන අතර වැඩ කරන වීසා බලපත්‍රයක් දීර්ඝ කල නොහැක. කෙසේවුවද, ඔබ ඕස්ට්‍රේලියාවේ මාස තුනක් හෝ හයක් සම්පූර්ණ කර ඇතිනම්, ඔබ හට දෙවන හෝ තෙවන නිවාඩු ගතකරන අතර වැඩකරන වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට හැකිය.

සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා විශේෂිත වැඩ කොන්දේසි බලන්න.

කෝවිඩ්-19 හේතුවෙන් දෙවන හෝ තෙවන නිවාඩු ගතකරන අතර වැඩ කරන වීසා බලපත්‍රයක් සඳහා අයදුම් කිරීමට අවශ්‍ය මාස තුනේ හෝ හයේ විශේෂිත වැඩ අවසන් කර නැතිනම් - සහ ඔබ තීරණාත්මක අංශයක වැඩ නොකරයිනම්, ඔබගේ මව්බිමට නැවත යාමට හැකිවන තෙක් නීත්‍යානුකූලව රැඳී සිටීම සඳහා ඔබ විසින් වෙනත් වීසා බලපත්‍රයකට අයදුම්කල යුතුය.

නව වීසා බලපත්‍රයක් ප්‍රදානය කිරීම සඳහා එම වීසා බලපත්‍රයට අදාල, වයස් සීමා, ඉංග්‍රීසි භාෂාව, සෞඛ්‍යය සහ චරිත සම්බන්ධ අවශ්‍යතා සපුරාලිය යුතුය.

## 8547 වීසා කොන්දේසිය - එක් සේවායෝජකයෙකු සමඟින් මාස හයක් වැඩකල හැකි බවට වූ සීමාව

නිවාඩු ගතකරන අතර වැඩ කරන වීසා බලපත්‍රයක් ඇති අය හට ඔවුන් ඕස්ට්‍රේලියාවේ සිටින අතරතුර ඕනෑම වැඩක් කල හැකිය. දෙපාර්තමේනතුව මගින් එක් සේවායෝජකයෙකු සමඟ වැඩකරන කාලය මාස හයකට වඩා කිරීමට අනුමැතිය දී ඇතිනම් මිස සාමාන්‍යයෙන් එක් සේවායෝජකයෙකු සමඟ වැඩකල හැකි කාලය මාස හයකි.

නිවාඩු ගතකරන අතර වැඩ කරන වීසා බලපත්‍රයක් ඇති අය හට එක් සේවායෝජකයෙකු සමඟින් මාස හයකට වැඩි කාලයක් වැඩකිරීමට දෙපාර්තමේන්තුව මගින් ලබාදී ඇති අනෙක් අවස්ථාවන් අතර පහත අවස්ථා ඇතː

- විවිධ ස්ථානවල වැඩ කරන අතර එක් ස්ථානයක මාස හයක් ඉක්මවා නොයන අවස්ථාව
- ඕස්ට්‍රේලියාවේ ඕනෑම ස්ථානයක සත්ව සහ ශාඛ වගාව
- නොදර්න් ඕස්ට්‍රේලියාවල පමණක් සමහර කර්මාන්තවල
- ලැව්ගිනිවලින් යථා තත්වයට පත්වීමේ උත්සාහයන්

වෙන ඕනෑම අවස්ථාවක, එකම සේවායෝජකයා සමඟ මාස හයකට වැඩියෙන් වැඩ කිරීම සඳහා ඔබ විසින් අනුමැතිය ලබාගත යුතුය.

## මම කාලීන සේවක හෝ පැසිෆික් ශ්‍රම වැඩසටහන හා සම්බන්ධවන අයෙකි

### පැසිෆික් ශ්‍රම වැඩසටහනේ උපකාණ්ඩ 403 වීසා බලපත්‍රධාරීන්

ඔබ සහ ඔබගේ සේවායෝජකව subclass 403 visa in the Pacific Labour Scheme වැඩසටහන හා සම්බන්ධවීමට විදේශ කටයුතු සහ වෙළඳ දෙපාර්තමේන්තුව මගින් පිළිගෙන ඇතිනම් ඔබට යටතේ වීසා බලපත්‍රයකට අයදුම් කල හැකිය. මෙම වීසා බලපත්‍රය මගින් ඔබට නැවත ඔබගේ රටට යාමට හැකිවන තෙකක් අවශ්‍ය නම්, දිගටම ඕස්ට්‍රේලියාවේ නීත්‍යානුකූලව සිටීමටත් දිගටම වැඩ කරගෙන සිටීමටත් හැකියාව ලැබේ.

### කාලීන සේවක වැඩසටහන යටතේ උපකාණ්ඩ 403 වීසා බලපත්‍රධාරීන්

ඔබගේ වීසා බලපත්‍රය දික්කල නොහැක. කෙසේවුවද, කෝවිඩ්-19ට ප්‍රතිචාර වශයෙන් තීරණාත්මක අංශවල වැඩ කරන අය සඳහා ඕස්ට්‍රේලියානු රජය මගින් නව ක්‍රියාමාර්ග හඳුන්වාදී ඇත.

කෝවිඩ්-19 වසංගත කාලය තුළදී පහත අවශ්‍යතාවයන් සපුරාලයි නම්, ඔබ විසින් Temporary Activity (subclass 408 Australian Government Endorsed Event (AGEE) stream) වීසා බලපත්‍රයකට අයදුම් කිරීමට සුසුසුකම් තිබිය හැකියඃ

- ඔබගේ වීසා බලපත්‍රයයේ කාල ඉකුත්වීමට ආසන්න නම්
- ඔබගේ වීසා බලපත්‍රයේ කාලය දැනටමත් ඉකුත්වී ඇතිනම්
- ඔබ ඕස්ට්‍රේලියාවෙන් බැහැරව යා නොහැකිනම්
- ඔබ සෞඛ්‍යය, වයෝවෘද්ධ රැකවරණ හෝ කෘෂිකර්මාන්තය වැනි තීරණාත්මක අංශයක වැඩ කරයි නම්.

මෙම වීසා බලපත්‍රය මගින් ඔබට නැවත ඔබගේ මව්බිමට යාමට හැකියාව ලැබෙන තුරු ඕස්ට්‍රේලියාවේ නීත්‍යානුකූලව සිටීමටත්, දිගටම වැඩ කරගෙන සිටීමටත්, ඉඩකඩ ලබාදේ. කාලීන සේවක වැඩසටහන සහ පැසිෆික් ශ්‍රම  වැඩසටහනේ වැඩපිළිවෙලවල් මගින්, සේවායෝජකයන් ඇතුළුව, නව වීසා වැඩපිළිවෙල වෙත රැගෙන යන අතර කෘෂිකර්මාන්ත අංශය සමඟ ඇති සම්බන්ධතාවය දිගටම පවත්වාගනු ඇත.

### වීසා කොන්දේසි ඃ 8503 (තව දුරටත් රැඳී නොසිටිය හැකියඃ 8577 (සේවායෝජකයින් මාරු කිරීම)

කාලීන සේවක වැඩසටහන හෝ පැසිෆික් ශ්‍රම වැඩසටහන යටතේ වීසා උපකාණ්ඩ 403 යටතේ 8577 කොන්දේසිය යනු ස්වදේශ කටයුතු පිළිබඳ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව ඔබට සේවායෝජක මාරුකිරීමට අවසර ලබා දී නැතිනම්, ඔබට වැඩකල හැක්කේ එක් අනුග්‍රාහකයෙකු/අනුමත සේවායෝජකයෙකු සමඟ පමණි.

කෝවිඩ්-19 කාලයේදී, ඔබට අනුග්‍රාහකයන්/අනුමත සේවායෝජකයන් අතර මාරුවීමට හැකිය. ඔබට අනුග්‍රාහකයන්/අනුමත සේවායෝජකයන් මාරු කිරීමට අවශ්‍ය නම්, ඔබගේ සේවායෝජක විසින් පහත ආයතන හා සම්බන්ධ විය යුතුයඃ

- ඔබ කාලීන සේවකයෙකු නම්, අධ්‍යාපන, කුසලතා සහ රැකීරක්ෂා දෙපාර්තමේන්තුව
- ඔබ පැසිෆික් ශ්‍රම වැඩසටහනේ සිටීනම්, විදේශ කටයුතු සහ වෙළඳ දෙපාර්තමේන්තුව.

මෙම තාවකාලික වැඩපිළිවෙලවල් යටතේ, සේවායෝජකයන් විසින් සියළුම ඕස්ට්‍රේලියානු රාජකාරී ස්ථාන නීතිවලට අනුව කටයුතු කල යුතු අතර වෙනත් සියළුම සේවකයන් මෙන්ම ඕස්ට්‍රේලියානු රාජකාරී ස්ථාන නීති යටතේ ඔබට සමාන අයිතිවාසිකම් ඇත.

උපකාණ්ඩ 403 කාලීන සේවක වැඩසටහන යටතේ, කෝවිඩ්-19 කාලයේදී, ඔබගේ වීසා බලපත්‍රයට සම්බන්ධවී ඇති 8503 කොන්දේසිය (තව දුරටත් රැඳී සිටිය නොහැක) ස්වයංක්‍රීයව ඔබගේ වීසා බලපත්‍රයෙන් ඉවත්වන අතර එ මගින් ඔබට Temporary Activity (subclass 408 Australian Government Endorsed Event (AGEE) stream) visa වීසා බලපත්‍රයකට අයදුම් කල හැකිය.

ඔබ විසින් 8503 වීසා කොන්දේසිය ඉවත් කිරීමට ඉල්ලා සිටීමේ අවශ්‍යතාවයක් නැත.

## මා හට විශේෂ කාණ්ඩ වීසා බලපත්‍රයක් ඇත

නවසීලන්ත සහ ඕස්ට්‍රේලියානු වැසියන් වශයෙන් එකිනෙකාගේ රටෙහි සිටීමටත් වැඩ කිරීමටත් අපට හැකියාව ඇත.

## මා හට බ්‍රිජිං වීසා ඒ, බී, හෝ සී බලපත්‍රයක් ඇත

බ්‍රිජිං වීසා ඒ, බී, සහ සී බලපත්‍ර මගින් ඔබගේ නව වීසා අයදුම්පත්‍රය සලකා බලන අතරතුර ඔබගේ වර්තමාන වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වීමෙන් පසු ඕස්ට්‍රේලියාවේ රැඳී සිටීමට ඉඩ සලසයි.

### වැඩ කිරීමට ඇති අයිතිය

ඔබගේ බ්‍රිජිං වීසා බලපත්‍රයේ කොන්දේසි අනුව ඔබට ඕස්ට්‍රේලියාවේ වැඩ කිරීමට ඉඩ ලබාදිය හැකිය.

පහත ආකාරයට බලාගත හැකිය:

- VEVO සේවාව භාවිතයෙන්, හෝ
- ImmiAccount ඔස්සේ ඔබගේ වීසා බලපත්‍ර කොන්දේසිවලට ප්‍රවේශවීම මගින්.

ඔබ දුෂ්කර මූල්‍ය තත්වයක සිටිනම් සහ ඔබගේ බ්‍රිජිං වීසා බලපත්‍රය මගින් ඔබට වැඩ කිරීමට ඉඩ ලබා නොදේනම්, හෝ වැඩ කිරීම සම්බන්ධ සීමාවන් ඇතිනම්, ඔබට වැඩ කිරීමට ඉඩ ලබාදෙන බ්‍රිජිං වීසා ඒ බලපත්‍රයකට අයදුම්කල හැකිය. කෙසේවුවද ඔබ මූල්‍ය දුෂ්කරතාවයක සිටින බවට පෙන්විය යුතුය.

ඔබ හට වැඩ කිරීමේ අවශ්‍යතාවය සපුරාලන්නේ නැතිනම්, සහ තවදුරටත් බ්‍රිජිං වීසා බලපත්‍රයකට සුදුසුකම් ලබන්නේ නම්, ඔබගේ කලින් බ්‍රිජිං වීසා බලපත්‍රයේ තිබූ කොන්දෙසි සමඟින්ම නව බ්‍රිජිං වීසා බලපත්‍රයක් ලබා දෙනු ඇත.

පහත අවස්ථාවල ඔබට වැඩ කිරීමට ඉඩ ලබාදෙන බ්‍රිජිං වීසා බලපත්‍රයක් ප්‍රදානය නොකරනු ඇත:

- ඔබගේ වර්තමාන බ්‍රිජිං වීසා ඒ බලපත්‍රය ප්‍රදානය කලේ ඔබගේ මුල් වීසා අයදුම්පත්‍රය සම්බන්ධයෙන් ලබාදුන් තීරණය සම්බන්ධ අධිකරණ සමාලෝචනයක් සම්බන්ධයෙන් අයදුම්කර තිබීම හේතුවෙන් නම්, හෝ
- ඔබ විසින් ආරක්‍ෂණ වීසා බලපත්‍රයක් සඳහා අයදුම්කර ඇතිනම්.

බලන්න: අයදුම් කරන ආකාරය සම්බන්ධ තොරතුරු

### බ්‍රිජිං වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වීම

ඔබගේ වීසා බලපත්‍රයේ කාලයෙන් ඔබ්බට ඕස්ට්‍රේලියාවේ රැඳී සිටීමට අවශ්‍යනම්, ඔබ විසින් වෙනත් වීසා බලපත්‍රයකට අයදුම් කල යුතුය.

## මා හට බ්‍රිජිංවීසා ඊ බලපත්‍රයක් ඇත

මෙම තාවකාලික වීසා බලපත්‍රය මගින් ඔබ පහත දේ කරන අතර ඔබට ඕස්ට්‍රේලියාවී රැඳී සිටීමට ඉඩකඩ ලබාදේ:

- පිටත්ව යාමට කටයුතු පිළියෙල කර ගැනීම
- ඔබගේ සංක්‍රමණ කටයුත්ත අවසානයට පත්කර ගැනීම
- සංක්‍රමණ තීරණයක් ලැබෙන තුරු බලා සිටීම.

### වැඩ කිරීමේ අයිතිය

ඔබගේ බ්‍රිජිං වීසා බලපත්‍ර කොන්දේසි අනුව ඔබට වැඩ කිරීමට අයිතිය තිබිය හැකිය.

ඔබට පහත ආකාරයට සොයා ගත හැකියඃ

- VEVO සේවාව භාවිතයෙන්, හෝ
- ImmiAccount ඔස්සේ ඔබගේ වීසා කොන්දේසිවලට ප්‍රවේශවීම.

### බ්‍රිජිං වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වීම

ඔබගේ වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වීමට පසු ඕස්ට්‍රේලියාවේ රැඳී සිටීමට අවශ්‍යනම්, ඔබ විසින් වෙනත් වීසා බලපත්‍රයකට අයදුම් කල යුතුය.

### තත්ව විසඳාලීමේ සේවාව (Status Resolution Service)

Status Resolution Service (SRS) වැඩසටහන මගින් ඔබට අවශ්‍ය තාවකාලික උපකාර ලබාදිය හැකිය.

ඔබ පහත ආකාරයේ නම්, උපකාර ලබා ගැනීමට සුදුසුකම් තිබිය හැකියඃ

- ඕස්ට්‍රේලියාව තුල වීසා බලපත්‍රයක් නැතිව ජීවත්වීම
- නීතිවිරෝධී ආකාරය මුහුදින් පැමිණ (illegal maritime arrival (IMA)) වලංගු තාවකාලික ආරක්ෂණ වීසා බලපත්‍රයක් (Temporary Protection Visa (TPV)) හෝ ආරක්ෂක ක්ෂේමභූමි ව්‍යවසාය වීසා බලපත්‍රයක් (Safe Haven Enterprise Visa (SHEV)) යොමු කිරීම
- IMA නොවන අයෙකු වලංගු ආරක්ෂණ වීසා බලපත්‍රයක් යොමු කිරීම
- බ්‍රිජිං වීසා ඊ (Bridging Visa E (BVE)) වීසා බලපත්‍රධාරියෙකු වීම
- ඔබගේ සංක්‍රමණ තත්වය විසඳා ගැනීමට සැලකිය යුතු ආකාරයේ බාධා ඇතිවීම.

## මාගේ වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වී ඇත

### ඉකුත්වී දින 28ක් ඇතුලත

ඔබගේ වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වී ඇතිනම්, නීත්‍යානුකූලවීම සඳහා හැකි විගස Bridging visa E (BVE) වීසා බලපත්‍රයකට අයදුම්කල යුතුය. BVE යනු ඔබ ඕස්ට්‍රේලියාවෙන් පිටත්ව යාමට කටයුතු පිළියෙල කර ගන්නා අතරතුර ඔබව නීත්‍යානුකූලව තැබීම සඳහා ලබාදෙන කෙටි කාලීන වීසා බලපත්‍රයකි.

ඔබට ඕස්ට්‍රේලියාවේ වඩා දිගු කාලයක් සිටීමට අවශ්‍ය නම්, ඔබ විසින් නව වීසා බලපත්‍රයකට අයදුම් කල යුතුය. ඔබට ඇති වීසා විකල්පයන් සහ ඔබ නව වීසා බලපත්‍රයකට අයදුම් කරන අතරතුර නීත්‍යනුකූලව සිටීම සඳහා කල යුතු දේ ඔබගේ අවස්ථානුගත කරුණු අනුව වෙනස්වේ. ඔබගේ වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වී කොපමණ කාලයක් ගතවී ඇතිද යන්න මත, ඔබ ඕස්ට්‍රේලියාවේ සිටිද්දී තව වීසා බලපත්‍රයකට අයදුම් කිරීමේදී සීමාවලට මුහුණ දිය හැකිය.

වීසා අයදුම්පත්‍ර ක්‍රියාවලිය සම්බන්ධ සමහර සේවා කෝවිඩ්-19 හේතුවෙන් ප්‍රමාද විය හැකිය. එසේම අප විශ්වසය තබා ඇති සේවාවන් රැසක් (වෛද්‍ය පරීක්ෂණ සහ ජීවමිතික රැස්කිරීම් වැනි) ලබාගත නොහැකි තත්වයේ ඇත. පරීක්ෂණයන් සම්පූර්ණ කිරීම සහ ඉල්ලා සිටින ලද තොරතුරු ලබාදීම සඳහා අයදුම්කරුවන් හට අමතර කාලය ලබාදෙනු ඇත.

### දින 28කට වඩා කල් ඉකුත්වී ඇතිනම්

ඔබගේ වීසා බලපත්‍රයේ කාලය ඉකුත්වී දින 28කට වඩා වැඩිනම්, ඔබගේ සංක්‍රමණ තත්වය විසඳා ගැනීමට උපකාර ලබා ගැනීම සඳහා කරුණාකර Status Resolution Service (SRS) හා සම්බන්ධ වන්න.